

# 1

# ප්‍රජනනය හා රතිය
## Reproduction and Sexuality

### a. නොයෙක් ආකාරයේ ප්‍රජනනය

ප්‍රජනනය නම් එක් ජීවී ඒකකයක් ඒකක දෙකක් හෝ වැඩි ගණනක් බවට පත් වීමේ ක්‍රියාවලියයි. වෙනත් වචනවලින් කිවහොත් එක් ඇමීබාවෙකු ඇමීබාවන් දෙදෙනෙකු බවට පත් වීම ප්‍රජනනයයි. ඇමීබාවා යනු එක සෛලයකින් පමණක් සැදි ලෝකයේ සිටින ඉතාමත් සරල අන්වීක්ෂයෙන් බැලිය යුතු සතෙකි. පහත 1.1 රූපයෙන් පෙනෙන්නේ තත්පර ගණනක් තුළ දී සම්පූර්ණ වන උගේ ප්‍රජනන ක්‍රියාවලිය.




රූපය 1.1 - ඇමීබාවාගේ ප්‍රජනනය.

එක් ඇමීබාවා (සටහන i) දෙදෙනෙකු (සටහන vi) වන සැටි ඉන් පෙනෙයි. නමුත් මානව ප්‍රජනනය මීට හාත්පසින්ම වෙනස් බව ඔබ දනී. පහත 1.2 රූප සටහන බලන්න.




රූපය 1.2 - මානව ප්‍රජනනය

ජයතිස්සගේ ජන්මාණුවක් එනම් ශුක්‍රාණුවක්, රසිකාගේ ජන්මාණුව වන ඩිම්බයක් සමග එකතු වූ විට, නව සෛලයක් සෑදෙයි. යුක්තාණුව යනුවෙන් හැඳින්වෙන මෙම සෛලය පසුව කලලයක් බවටත්, ඉන් පසුව මාධව නම් වූ දරුවා බවටත් පත් වුණු බව පෙනෙයි.

ජන්මාණු එකතු වීමෙන් සිදු වන මෙම ප්‍රජනනය, ලිංගික ප්‍රජනනය ලෙසත්, එසේ නොමැතිව සිදුවන ප්‍රජනනය අලිංගික ප්‍රජනනය ලෙසත් හැඳින්වේ.

## b. රතිය හා ප්‍රජනනයේ සම්බන්ධතාව

ජීවි කොට්ඨාශයක පැවැත්ම සඳහා ප්‍රජනනය අත්‍යවශ්‍ය වෙයි. එබැවින් ජීවීන් ඒ සඳහා පොළඹවන යාන්ත්‍රණයක් තිබිය යුතුය. ලිංගික ප්‍රජනනයේ දී මේ සඳහා ජීවීන් දෙදෙනෙකු මෙහෙයවනු ලබන බලවේගය රතිය නම්.

එනම් යම් ආකාරයකට ගැළපෙන කායිකව පරිණත වූ ජීවීන් දෙදෙනෙකු එකිනෙකා හමු වූ විට, ආකර්ෂණයක් ඇති වෙයි. මින් බැඳෙන දෙදෙනා කායිකව එක් වෙති. මෙයට සංසර්ගය යැයි කියති. එවිට ජන්මාණු එකට එකතු වී නව කලලයක් හට ගනියි.

එහෙත් මෙය හැම විටම සාර්ථකව සිදු නොවේ. එනම් ජන්මාණු දෙක එකිනෙකා හමු නොවීම, හමු වුණත් හැදෙන යුක්තානුව, එය වැඩීම සඳහා සුදුසු තැනක තැන්පත් නොවීම වැනි කාරණා ඊට හේතු විය හැක. එබැවින් නැවත නැවත කායිකව එක් වීම, නව කලලයක් ඇතිවීමේ ඉඩකඩ වැඩි කරයි. ඒ අනුව රතිය ඉතා ප්‍රබල ආවේගයක් වීමත්, නිතර නිතර නැගී ඒමත් පුදුමයට කරුණක් නොවේ.

මානවයාගේ දියුණුවත් සමගම දරුවන් සාර්ථක ලෙස වැඩිහිටියන් බවට පත්වීම සුලබ වන්නට විය. එනම් ළදරු හා බාල වයස් මරණ අඩු වන්නට විය. එසේම අඩු දරුවන් සංඛ්‍යාවක් සිටින විට ඔවුන් වඩා සාර්ථක වැඩිහිටියන් බවට පත් කළ හැකි බව දෙමව්පියෝ තේරුම් ගත්හ. ඒ අනුව නිතර නැගී එන රතිය සන්තර්පනය කිරීමටත්, එහෙත් ඉන් නිතර ප්‍රජනනය නොකිරීමටත් මානවයා ක්‍රම සොයන්නට පටන් ගත්තේ ය.

## c. රතිය හා ප්‍රජනනය වියුක්ත වීම

උපත් පාලනය සොයා ගැනීමත් සමගම රතිය ප්‍රජනනයෙන් වෙන් කරනු ලැබිණ. තවදුරටත් කායික සංසර්ගය සහ ලිංගික ප්‍රජනනය යනු එකක් නොව, දෙකක් විය. රතිය හා දරුවන් සෑදීම අතර සම්බන්ධය ටිකෙන් ටික අතුරුදහන් විය. රතියේ ප්‍රධානම අවශ්‍යතාවය රතියම විය. එහි ප්‍රධාන කාර්යය වූයේ සැපත ලබාදීම ය.

ඕනෑම සත්ත්ව කාණ්ඩයක සංසර්ගය බහුල වන විට ප්‍රජනනය ද බහුල වෙයි. එනමුදු සත්ත්ව ඉතිහාසයේ පළමු වතාවට අද ලෝකයේ මානවයා නම් සත්ත්ව කාණ්ඩයේ සංසර්ගය ඉතා බහුල වී ප්‍රජනනය ඊට සාපේක්ෂව ඉතා දුලබ වී ඇත.

මේ අනුව බලන කල ද රතිය යනු කෙතරම් ප්‍රබල ආවේගයක් ද යනු පෙනී යයි.

## d. රතියේ විශේෂතා

රසිකාට තිස්ස දුටු විට ආසාවක් ඇති වෙයි. ඔහුගේ සමාගමයේ දී ඇයට සතුටක් දැනෙයි. තිස්සගේ නිරුවත දකින රසිකාට ඔහු හා කායිකව බැඳීමට සිත දෙයි. එසේම ඔහු හා එසේ එක් වෙයි. ඉන් සැපතක් ලබයි. සැනසුමක් දැනෙයි. තාවකාලිකව එසේ එක්වීමට දැනුණු ආවේගය යටපත් වෙයි.

තිස්ස වෙන ළඳක් හා ළැදිව දෙඩන විට, රසිකාට මඳ නොසතුටක් දැනෙයි. එය නොරිස්සයි.

මේ අප බැලුවේ රතියේ යම් මතුවීම් ය. රසිකාට තිස්ස හා එක්වීමට ඇති වන කැමැත්ත රති දෙළ (sexual desire) නමින් ද, එසේ ඇතිවන ආසාව/ආවේගය රති ආවේගය (sexual urge) නමින් ද සාමාන්‍යයෙන් හැඳින්වේ. මේ දෙක බොහෝ දුරට සමාන ගති ඇති භාවයන් ය.

මේ දෙදෙනාගේ කායික එක්වීම රමණය (sexual activity) යනුවෙන් ද, ලිඟු අතර සිදුවන එක් වීම සංසර්ගය (sexual intercourse) යනුවෙන් ද අපි කියමු. මේ අනුව සංසර්ගය යනු රමණයේ එක් කොටසක් පමණි. එය ද අනිවාර්ය අංගයක් නොවන අවස්ථා ඇත.

ඔහු මා හා විඳින සැප හෝ ඊට වැඩි සැප අන් ළඳක හා ලබයි ද, නැතිනම් අන් ළඳක මා විඳින සැප හෝ ඊට වැඩි සැපයක් ලබයි ද, නැතිනම් මේ දෙකම ද යන සැකයන් සමග ඇති වන භාවයන් (emotions) රති මාත්සර්යය (sexual jealousy) නම් වේ. මෙය ඉරිසියාවට වඩා මඳක් වෙනස් වේ.

ඕනෑම භාවයකට ඇති ගති ලක්ෂණ රති භාවයන්ට ද ඇත්තේ ය. භාවයක් තමන්ට රිසි ලෙස ඇති කිරීමත් නැති කිරීමත් අසීරු ය. භාවයට හේතු වූ දේ අතුරුදහන් වූ පසු ද, භාවය යම් වේලාවක් සිතේ දැවටෙයි. චේතනාව (thought) අනුව භාවයන් වෙනස් වෙයි. එසේම භාවයන් අනුව චේතනා වෙනස් වෙයි.